බදුල්ල මහා නගර සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු මුදල රු.552,304 අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ගිණුම් 12 කට අදාළව ලැබිය යුතු පොලිය රු.1,117,568 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,539,660 ක් වූ මෝටර් රථ හා කරත්ත 6 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.14,020,774 ක් වුවද, මුල්‍ය ප්‍රකාශන වල රු.12,900,533 ක් ලෙසට රු.1,120,241 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ආදායම රු.15,683,570 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.16,542,917 ක් ලෙසට රු.859,347 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි |

(ආ) <u>නොසැසදුණු පාලන ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගය රු.13,523,110 ක් වු අතර, උපලේඛන වල රු.13,070,504 ක් ලෙස දැක්වීමෙන් රු.452,606 ක වෙනසක් විය. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.768,346,614 ක්වු වත්කම් විෂයයන් 02 ක් සහ රු.21,685,016 ක් වු වගකීම් විෂයයන් 02 ක් ඔප්පු, පිඹුරුපත් හා පැවරුම් නියෝග, තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන කරනලද තොග පොත්, ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සියලුම සාක්ෂි ඇතුලත් කර ගිණුම් ඉදිරිපත් කිරීමට සියලුම නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති,රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

| නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) <u>මහා නගර සභා ආඥා පනත</u> | | | |
| (i) 218 වගන්තිය | එක් එක් මුදල් වර්ෂයක් අවසානයේ මහා නගර සභාවේ පරිපාලනය පිළිබඳව සවිස්තර වාර්තාවක් සභාව වෙත හා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii)254(1) වගන්තිය | සභාවට අයවිය යුතු වරිපනම් බදු වෙනත් ගාස්තු හා දඩ මුදල් රු.106,670,979 ක් නාගරික කොමසාරිස්වරයා විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර අරමුදලට බැර කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | සේවය අතහැර ගිය සහ වැඩ තහනමට ලක්වූ නිලධාරින් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,335,035 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | අයවිය යුතු ණය ශේෂ අයකර ගත යුතුවේ. | මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මු.රෙ 751 | ගබඩා ලෙජරයේ භාණ්ඩ ලැබීම් හා නිකුත්කිරීම් නිසි පරිදි ගණනය කර ශේෂය දක්වා නොතිබුණි. | ගිණුම් පොත් පත් නිවැරදිව පවත්වාගෙන යා යුතුවේ. | මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) මු.රෙ 754 | 2015 වර්ෂයේ සිට තොග ලේඛන තුලනය කර නොතිබුණි. | තොග ලේඛනය නිවැරදිව පවත්වා ගත යුතුවේ. | මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,835,497 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,789,058 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 28,927,500 | 16,184,444 | 16,066,898 | 21,893,698 | 30,510,000 | 20,890,539 | 17,862,093 | 22,590,623 |
| ii. | කුලී | 27,934,800 | 26,485,590 | 25,949,493 | 8,827,987 | 24,838,420 | 26,881,602 | 23,659,405 | 10,320,106 |
| iii. | වෙනත් ආදායම් | 683,296,700 | 270,354,960 | 276,092,043 | 72,159,109 | 581,387,680 | 239,350,545 | 262,858,260 | 25,244,935 |
| | එකතුව | 740,159,000 | 313,024,994 | 318,108,434 | 102,880,794 | 636,736,100 | 287,122,686 | 304,379,758 | 58,155,664 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.313,024,994 ක් මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.102,880,794ක් අය කර නොතිබුණු අතර,එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 33 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | විශේෂ වැඩසටහනක් යටතේ හිඟ ආදායම් අයකර ගනිමි. |
| (ආ) ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක වසරකට අධික කාලයක සිට පැවත එන එකතුව රු.104,785,571 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනිමි. |

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ව පැවති උසාවි දඩ ගාස්තුව රු.8,000,000 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | ඌව පළාත් සභාවට දන්වා ලබාගැනීමට කටයුතු කරමි. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.27,500,000 ක් අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | ඌව පළාත් සභාවට දන්වා ලබාගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත්කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරමි. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අයත් වින්සන්ට් ඩයස් ක්‍රීඩාපිටියේ කොටසක් කසල රැස් කිරීමට යොදා ගෙන තිබුණු අතර, එහි කාබනික පොහොර නිෂ්පාදන කටයුතු කරමින් පැවතුණි. එමෙන්ම වර්ෂා කාලවලදී එහි රැස්වන ජලය හා කසල බදුලුඔයට ගලා ගොස් පාරිසරික ගැටළු ඇති කිරීමට හේතු වී තිබුණු බවද නිරීක්ෂණය විය. | ඝන අපද්රව්‍ය කළමනාකරණයකින් යුතුව බැහැර කළ යුතුවේ. | දිරන සහ නොදිරන කසල ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. |
| (ii) | 2017 අගෝස්තු 18 දින වන විට වසර 02 කට ආසන්න කාලයක් තුලදී එකතුවූ මෙට්‍රික් ටොන් 26000 ක පමණ නොදිරන ඝන පොලිතින් ද්‍රව්‍ය ප්‍රතිචක්රීකරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයකින් යුතුව බැහැර කළ යුතුවේ. | දිරන සහ නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ 'තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030' පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හදුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හදුනාගෙන ඒ අනුව | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හදුනාගෙන කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවේ ආදායම් ගිණුම් ගත කිරීම සඳහා ස්වයංක්‍රීය මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් රු.308,008 ක වියදමක් දරා උපකරණ මිළදී ගෙන තිබුණු අතර, එම උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. | මෘදුකාංග පද්ධතිය භාවිතයට ගත යුතුවේ. | දැනට වරිපනම් අංශයේ ඉ-පළාත් පාලන ක්‍රියාත්මක වෙමින් පවතී. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී රු.73,405,084 ක වියදමක් දරා ඉදිකරන ලද රථගාල කළමනාකරණය සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපනය කර සේවකයක් 9 දෙනෙකු සේවයේ යොදවා තිබුණද, ආදායම් වර්ධනය කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා සහන පැකේජ හා නගරයට ප්‍රවේශ වන වාහන දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන පුවරු සවිකරමි. |
| (ඇ) | වසරකට අධික කාලයක සිට පැවත එන ණයහිමි ශේෂ 3 කට අදාල එකතුව රු.36,196,395 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රතිපාදන ලබාගැනීමෙන් පසුව ගෙවා අවසන් කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 01 කට අදාලව අතිරික්ත කාර්ය මණ්ඩලය18 ක් විය. | අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරගත යුතුවේ. | අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 03 කට අදාල පුරප්පාඩු 10 ක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු පිරවිය යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 හා 2018 වර්ෂ වලදී නගරයේ රථවාහන ගාස්තු අයකිරීම වෙනුවෙන් බදුකරුවන් දෙදෙනෙකු සමඟ ඇති කරගත් ගිවිසුම අනුව සභාවට ලැබිය යුතු රු.1,388,678 ක ආදායම් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී. |

3.5 නිෂ්ක්‍රිය වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | රු.625,000 ක් වටිනා ට්‍රැක්ටර් රථ 03 ක් හා යතුරු පැදි 02 ක් වසර 5 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුනි. | අළුත්වැඩියා කිරීම හෝ එසේ නොහැකි නම් විධිමත් පරිදි අපහරණය කිරීම කළ යුතුවේ. | අළුත්වැඩියා කිරීම සඳහා අමතර කොටස් වෙළඳපොලේ නොමැති බැවින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | 2017 වර්ෂයේදි මිලදීගෙන තිබුණු රු.329,120 ක් වටිනා කාර්යාල උපකරණ 23 ක් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | මිලදිගත් වත්කම් වලින් නිසි ප්‍රයෝජන ගත යුතුවේ. | දැනට භාවිතය සඳහා නිකුත් කරමි. |

3.6 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව සම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |